## ආප්තෝපදේශ

අපේ රටේ ආප්තෝපදේශ කියලා ජාතියක් තියෙනවා කියලා අපි කවුරුත් දන්නවනේ. ප්‍රස්ථා පිරුළු කියලා කියන්නෙත් මේවට තමයි. ඔය බොහෝමයක් පිරිළු අතරින් අර "බල්ලා පිදුරු කන්නෙත් නැහැ කන ගොනාට දෙන්නෙත් නැහැ" කියන එක හරි ජනප්‍රියයිනේ. මොකද ඒක හුඟක් වෙලාවට ඕනෑම ක්ෂෙස්ත්‍රයකට ගලපගන්න පුළුවන් නිසා.

අපි ලංකාවෙදි හිතුවට අපේ දේවල් එහේ විතරයි කියලා දැං මෙහේ ඇවිල්ලත් සෑහෙන කාලයක් ජනගහනයන් ප්‍රමාණයෙන් ඉහලයි. වැඩත් විවිධයි. විෂමයි විශාලයි නිසා හුඟක් ප්‍රස්ථා පිරුළු මෙහෙටත් දැං කදිමට ගැලපෙනවා. මෙහේ ඉතිං නිතරම



මිනිස්සු එකිනෙකා සම්බන්ධ වෙන්නේ සමාජයීය කටයුතු, කලා, මාධ්‍ය, ආගමික කටයුතු වලදිනේ. ඉතිං මේ කොයිකෙදි උනත් අපේ මිනිස්සු එකතු උනහම අපේ කම, අපේ ගති, අපේ පුරුදු නිතැතින්ම මතුවෙන්නේ චූටි මල්ලිටත් ඕවා ගැන හොඳ අත්දැකීම් තිබෙනවා. අපි මොන හොඳ දේ කරන්න ගියත් කොටසක් හදන්නේ ඒක බකල් කරන්නමයි. මොකද තමන්ට එතන තැනක් මූලිකත්වයක් නැත්නම් ඒක නොකෙරෙන තැනට තමයි වැඩ කරන්නේ.

මේ බොහෝ වැඩ හැමෝටම බැහැනේ. හැකියාව උපතින්ම ලැබෙන දෙයක්. ඉතිං හැබෑ දක්ෂයෙක් යමක් කරන්න හැදුවොත් තමන්ට ඒ කාර්යය කිරීමට බැරි කම ඇති අය කුහකකම සහ ඊර්ෂියාවෙන් අර මනුස්සයා කරගෙන යන වැඩේ බකල් කරන්නට ඇටවිය හැකි හැම උගුලක්ම ඇටවීම මෙහේ තවත් ඇති රෝගයක්. වැඩේ කියන්නෙ තම තමන්ගෙ කුහක කම් මේ මිනිස්සු කිසිම හිරිකිතයක් නැතුව ප්‍රදර්ශනය කරන එකනෙ සහෝ.

බැරි බැරියාව නැමැති රෝගයට බෙහෙත් තවම හොයගෙන නැති නිසා මේ රෝගය ඉදිරියටත් මෙහේ පවතීවි. කණගාටුවට කරුණ නම් තමන්ට කෙසේවත් නිර්මාණාත්මකව යමක් කරන්නට නොහැකි බව ඔප්පු වී තිබියදීත් යහපත් සිතින් යම් කාරණයක් කරන්නාට එරෙහිව යටි උගුල් අදින්නට උත්සාහ කරන පුද්ගලයන් මෙල්බන් වැනි නගරයක සිටීමයි.

මේ තත්වය මෙසේ වර්ධනය වීමෙන් සිදුව ඇත්තේ යමක් කළ හැකි අය බොහෝ සමාජීය කටයුතු වලින් දුරස් වී හා ඒ ගැන නිද්‍රාශීලීව උකටලීව කටයුතු කරන්නට පුරුදු වී තිබීමයි. සමාජයක් හා පුද්ගලයන් ලෙස ප්‍රශ්න තිබූ ආරම්භක අවධියේ තිබූ එකමුතු බව හා සංවේදී බව කාලයත් සමග ප්‍රශ්න සමනය වීමෙන් පසු යටපත් වීම කණගාටුවට කරුණක්.

අප මිනිසුන් ලෙස සමාජයක් ලෙස අවධියෙන් කටයුතු කරන්නේ නම් මේ බල්ලන් බැඳ තබා දැමිය හැකි බවත් ගොන්නුන්ට තණකොළ කෑමට ඉඩදිය හැකි බවත් මතක් කරන්නට කැමැතියි.

## ඇත්ත සහ නැත්ත

අපේ අයගෙන් වැඩි කොටසක් අහන්නේ බලන්නේ BBC, රොයිටර්, CNN වගේ බොහෝ විට බටහිර ගැති ප්‍රවෘත්තිනේ. දීර්ඝ කාලයක් මේවට හුරු වෙලා අපි කොහොමත් විශ්වාස කරන්න හුරු වෙලා ඉන්නේ මෙයාලා කියන දේ තමයි. අනිත් කාරනේ තමයි අපි නිරායාසයෙන්ම රුසියාවේ මාස් හරි චීනයේ ෂිංහුවා එකේ හරි නිවුස් බොරු අසත්‍ය දේ කියලා බැහැර කරනවා. ඒත් අපි දිගටම ඒවාට සවන් දුන්නොත් බටහිර නිවුස් බොහෝ විට කියන්නේ බොරු හා අතිෂයෝක්තිය බව තේරුම්ගත හැකියි. අවාසනාවකට අපි බොහෝ දෙනෙකුට ඒ පහසුකම් හා අවබෝධය නැහැ.

අනෙක අපිට සත්‍ය සොයා යාමේ පුරුද්දක් නැහැ. දෙන දේ කාලා වෙන දේ බලාගෙන ඉන්න කොට්ඨාෂයක්නෙ අපි. චූටි මල්ලිට මෙහෙම හිතුනේ දැං මේ දවස්වල උතුරු කොරියාවේ කිම්ගෙ න්‍යෂ්ඨික බෝම්බේ හා ජලකර බෝම්බේ අත්හදා බැලීම් ගැන හෙන භීතියක් ලෝකෙ පුරාම මවාගෙන යනවනේ. මේ මාධ්‍ය විසින් දැං ඔය කියන සේරම ඇත්තද? චූටි මල්ලිටනම් හිතෙන්නේ මේ කියන මහා බලවතුන් හා උතුරු කොරියාව අතර තියෙන්නේ බොහාම පොඩි වෙනසක් කියලා. මොකද කොරියාවේ උන් ඒක කිය කිය කරනවා. මහා බලවතුන් ඊටත් වැඩියෙන් අපිට නොකියා රහසේම කරනවා. අපි දකින්නේ කොරියන් වැඩ නිසා අපි සේරම උන්ට වෛර කරනවා. මාර තියරිය නේ.

දැං උතුරු කොරියාවේ න්‍යෂ්ටික අවි ලෝකෙට තර්ජනයක් වෙන්නේ කොහොමද අනෙක් බලවතුන්ගේ අවි ලෝකෙට තර්ජනයක් නොවෙන්නෙ කොහොමද? ඒක



දැන ගන්නට තියෙන විදියට නම් උතුරු කොරියාව කිසිම තර්ජනයක් කරන්නේ නැහැ. ආයුධ ටෙස්ට් කරනවා විතරයි. එතකොට මේ මවන භීතියේ අරමුණ කුමක්ද?. (උතුරු කොරියාවේ පාලන කිම් ජොන් අප්සට් ජොකියෙක් බව ඇත්ත. ඒත් ඒක වෙනම කතාවක්.) අප තේරුම් ගත යුත්තේ එයයි.

ලෝකය තිබිය යුත්තේ තමන්ට අවශ්‍ය ආකාරයට බව බොහෝ රටවල් හිතන බව අපි ඉතිහාසේ ඉඳලම දැක්ක දෙයක්. ඊට එරෙහිව සිතන ක්‍රියා කරන බොහෝ රටවල් අකර්මන්‍ය කිරීම ඔවුන්ගේ පුරුද්දක්. ඉතින් මේ වෙන්නේ ඒකම තමයි. ප්‍රශ්නය තියෙන්නේ ආසියාකරේ ඉන්න මිනිස්සුන්ගේ අවශ්‍යතාවට කිම් ජොන් නාහෙට නාහන නසරානියෙක්. මේ සෙට් එක දැකලා කරන දෙයින් පරිප්පුව කන්න වෙන්නේ අහල පහල උන්ට. ඒ නිසා මේ ගැන අවබෝධයෙන් ඉන්න එක ගැන කාට කාටත් හොඳයි වගේ.

## ආයෙමත් ක්‍රිකට්

කොච්චර කිව්වත් ලංකාවේ ක්‍රිකට් ගැන කතා කරන්නේ නැහැ කියලා කතා කෙරෙන නිසත්, බලන්නෙ නැහැ කිව්වට අවසානය හරි බැලෙන නිසාත්, ලියන්නේ නැහැ කිව්වට අමාරුවෙන් හරි ලියවෙන නිසා පොඩ්ඩක් වෙන්න ලියන්නේ මාර ඔරොප්පුවෙන්.



චූටි මල්ලිට නම් තියෙන්නේ ක්‍රීඩකයෝ ගැනවත් පුහුණු කරුවෝ ගැනවත් අවුල නෙවෙයි. ක්‍රිකට් බෝඩ් එකේ චොයිස් එක ගැන තද වීමක්. කොටින්ම මටනම් හිතෙන්නේ අපේ බෝඩ් එක සේරටම කලින් අවබෝධ කරගන්න



ඕනේ කාරණයක් තමයි ක්‍රිකට් වල රිදම් එක මොකක්ද කියලා. ඒක ගැන මෙයාලට අදෝ සංසාරයක දැනුමක් නැහැ.

මුකුත් ඕන නැහැ. දැං බලන්න මල්ලිලා අර ක්‍රීඩකයෝ හයක් හතරක් ස්කෝ කරනවා උඩරට නැට්ටුවොයි බෙර කාරයොයි ගෙනල්ලා දාන අඩව්ව. අපේ සංස්කෘතිය ජාත්‍යන්තරයට ගෙනියන්න හදන හැටිද මේ. යකෝ මේක ලැවරිය ඇතුලේ සොසේජස් දාලා කනවා වගේ කියලා තේරෙන්නෙ නැතිද එකෙකුටවත්.

ක්‍රිකට් වල රිදම් එක වෙනම එකක්. ඒකට ගැලපෙන රටාවක් තිබේය කියලා අවබෝධයක් නැති අයියලාගෙන් කොහොමද රටක ක්‍රිකට් දියුණුවක් බලාපොරොත්තු වෙන්නේ. වැඩේ වන වෙනකොට අයියලා ඕනතරම් දේවල් කියාවි නිදහසට. ඒත් දැං මේක තනිකරම "මයින්ඩ්සෙට්" ගේමක් කියලා අමුතුවෙන් කියන්න දෙයක් නැහැනේ. දැං ක්‍රිකට් ගහන්න වෙලා තියෙන්නේ අතේ පයේ හයියෙන් නෙවෙයි. තනිකරම ඔලුවෙන්. ඒ නිසා තනිකරම සෙට් එකේ ඔළුව තමයි හදන්න ඕන.

ලංකාවේ ක්‍රිකට් පූල් එකේ 100ක් විතර හිටියට උන් සේරම ගෙනල්ලා එක එකා මාරු කර කර ගහන්නේ ක්‍රිකට් ද නැත්නම් දාම්ද අදින්නේ කියලා දැං ලෝලියෝ අහන්නේ. අපිට තේරෙන විදියට ලොකු ලොකු කට්ටිය නම් මාරු වෙන්න ඕන තමයි. ඒත් සිලෙක්ට් කරලා ගේමට දාන සෙට් එකට අනුව මැච් පහ හයක්වත් එක දිගට ගහන්න දෙන්න ප්ලීස්. මූලික දේ උන්ට උන් ගැන ආත්ම විශ්වාසයක් ගොඩනගා ගන්න කාලයක් ලබාදෙන්න ගේමෙන් බ්ලොක් කරලා දාන්නේ නැතුව වැඩේ යන තාලෙට දුකයි තමයි. ඒත් බොර දියේ මාළු බාන සෙට් එකට නම් ඉඩක් ලැබෙන්නේ නැහැ කියලා තමයි අපි හිතන්නේ.

## එහෙ වැඩයි මෙහෙ වැඩයි

මේ සටහන ලියන්න පටන් ගත්ත අද උදේ ඕස්ට්‍රේලියාවෙ නිව්ස් රේඩියෝ එකේ ගිය නිව්ස් එකක් අහපු ගමන් මට මතක් වුණේ ලංකාව. ලංකාවෙත් කෙළින්ම මතකෙට ආවෙ සයිටම් එකට විරුද්ධව මාරාන්තික අරගලයක යෙදිලා ඉන්න අන්තරේ මල්ලිලයි ගොමා සංගමේ දොස්තරලයි.

මෙන්න සහෝලා නිව්ස් එක.

**"ඔස්ට්‍රේලියාවෙ විදේශ විනිමය ලැබෙන ආදායම් මාර්ග අතරින් තුන්වෙනි තැනට එන්නෙ අධ්‍යාපනය."**

කොහොමද වැඩේ.? අපේ ලංකාවෙ අය අධයාපනය එක්තරා පිරිසකය පමණක් සීමා කරන්න මාරාන්තිකව වලි කද්දි මේ රටවල ඒක ලස්සනට මාකට් කරන හැටි. ඇයි අපට බැරි මේක ලංකාවෙත් කරන්න.?

ඇත්තම කතාව නම් දැන් රටට පේන්න බොරුවට විරුද්ධ කමක් පෙන්නුවට රාජපක්ෂ උන්නැහෙත් මේ වැඩේ ලංකවෙ කරන්න වෑයමක් දැරුවා. ඒගොල්ලො ඒකට කිව්වේ "ලංකාව ආසියාවෙ අධ්‍යාපන



කේන්ද්‍රය කරනවා" කියලයි. ඇත්තටම ඒ වැඩේ එහෙම කළා නම් එක් හොඳ වැඩක් වෙන්න තිබ්බා. අපේ අක්කලා අම්මලා රට පටවලා සල්ලි හොයනවාට වඩා ගරු නම්බුකාර විදිහට රටට විශාල ආදායමක් ලබාගන්න තිබුණ මාර්ගයක්.

අර හැම දේටම විරුද්ධ වෙනවා කියන මානසිකත්වයෙන් කකුල් කැඩනකල් පෙළපාලි ගියාට වැඩක් නැහැ. අලුත් ලෝකෙට ගැළපෙන්න සිතුවිලි වෙනස් කරගන්න. ලිං මැඩියෝ වගේ ලංකාව ඇතුලෙ වෙන දේ විතරක් අත්දැකලා රටට විනාසයක් කරනවට වඩා ලෝකෙ දිහා ඇහැ ඇරලා බලන්න කියන එක තමයි චූටි මල්ලි කියන්නෙ. අපි එපා කියලා මොර දෙන දේ මෙන්න දියුනු රටවත් ලස්සනට අපටම විකුණනවා.

දැන්වත් මේ හීනෙන් මිදෙන්න සහොදරවරුනි.

චූටි මල්ලි